Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

විෂය:- නාට්‍ය හා රංග කලාව

සතිය - 02

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

**පහතරට සිංදු වන්නම්**

- සිංදු වන්නම් යන විශේෂ නාමයෙන් හඳුන්වා ඇත.
- භක්ති කාව්‍ය ලක්ෂණ ප්‍රකාශ කරන විනෝදාස්වාදයෙන් බැහැරව යොදාගත් නර්තන අංගයකි .
- විෂ්ණු දෙවියන්ගේ( උපුල්වන් දෙවියන්) ගුණ වර්ණනා ඇතුළත්ව ඇත.

**සින්දු වන්නම් රචනා වීම පිළිබඳ විවිධ මත**

- අන්ධ බ්‍රාහ්මණයකු තමන්ට පෙනීම ලබාදෙන ලෙස ඉල්ලා විෂ්ණු දෙවියන්ට පූජෝපහාර ලෙස වන්නම් පෙළ රචනා කර ඇති බව.( සී ද එස් කුලතිලක මහතා18වන්නම් කෘතිය)

- නෙත් අඳ පුද්ගලයෙකු තමන්ට පෙනීම ලබාදෙන ලෙස ඉල්ලා කවි පන්තියක් රචනා කර දෙන ලෙසට "බරණ ගණිතයා" ගෙන් ඉල්ලා ඇති අතර ඒ අනුව සින්දු වන්නම් රචනා කර ඇති බව (එම කවි උපුල්වන් දෙවියන් ඉදිරියේ ගායනා කිරීමෙන් ඇස් පෙනීම ඇති වූ බව ද සඳහන් ය)

**සුවිශේෂ කරුණු**

- දඹදෙණි හා කෝට්ටේ යුගයේ රචනා වී ඇත.

- සින්දු වන්නම් 32 කි .ඒවා දම් වැලක පුරුක් මෙන් එකිනෙකට සම්බන්ධව ඇත. එක් වන්නමක් අවසන්වන පදයෙන් හෝ අක්ෂරයෙන් අනෙක් වන්නම ආරම්භ වේ. උදාහරණ වශයෙන්
    - ශුද්ධ තාලය - ගංගා වෘත්තය "සුරිඳුනි අසන් මකියන බස් බැති පෙමිනා "
    - කොන්ඩනාවිච්චි තාලය -" පෙමිණ කුළුණු මිතුරු ගුණෙන"
    - සෑම සින්දු වන්නමකටම නියමිත වූ තාලයක් විරිතක් ඇත. එයින් සින්දු වන්නම හඳුන්වයි.

උදාහරණ වශයෙන්

- හනුමන්තා තාලයේ සිංදු වන්නම
- කොන්ඩනාවිච්චි තාලය
- ලලිතරාග තාලය
- නලු ගීතිකා තාලය
- අනුරාග දණ්ඩ තාලය

- සින්දු වන්නම ප්‍රධාන කොටස් හතරකි

  - බෙර පදය
  - තානම
  - කවිය
  - ඉරට්ටිය

ඉගෙනුම් ආධාරක

You tube

https://www.youtube.com/watch?v=9bANXdDyVN0&t=32s

https://www.youtube.com/watch?v=Veg1HBoesfo

https://www.youtube.com/watch?v=3fhtjmOPbog

කාර්ය පත්‍රිකාව

1. පහතරට වන්නම් රචනා වූ අරමුණ පැහැදිළි කරන්න.
2. සින්දු වන්නමක කොටස් නම් කරන්න.